# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## 52 වන උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 52 වන උපාධි ප්‍රදානෝත්සවය 2026 ඔක්තෝබර් මස 13, 14, 15 සහ 16 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට නියමිතය.

උපාධි ප්‍රදානෝත්සවය සඳහා අදාළ උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රය කැඳවීමේ ක්‍රියාවලිය පීය අනුව සිදුකරනු ලැබේ.

ඒ අනුව, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ (2025 දෙසැම්බර් මස පැවැති අවසාන උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනය අනුව) සුදුසුකම් ලබා ඇති උපාධිලාභීන් පහත සඳහන් උපදෙස් අනුව සම්පූර්ණ කරන ලද උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**(මෙය අනෙකුත් පීඨවල උපාධිලාභීන් සඳහාද නියමිත කාලයේදී දැනුම් දෙනු ලැබේ.)**

උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රය මෙම සබැඳියෙන් බාගත කරගත හැක.................................

<u>උපාධි ප්‍රදානෝත්සව ගාස්තු</u>

ප්‍රථම උපාධිය – රු. 6,500.00
ප්‍රථම උපාධිය (උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී නොවන විට) – රු. 6,500.00

පහත සඳහන් ලේඛනවල **PDF ආකෘතියෙන් පැහැදිලි ලෙස පරිලෝකනය (scan) කරන ලද පිටපත් පමණක්** **2026.06.12** දිනට පෙර **con.fmsc@sjp.ac.lk** විද්‍යුත් තැපැල වෙත එවිය යුතුය. (**මෙම ලේඛන බොඳ වූ, අඳුරු වූ/අපැහැදිලි හෝ JPG/JPEG වැනි ඡායාරූප ආකෘතියේ හෝ කැමරා/ජංගම දුරකථන මගින් ලබාගත් ඡායාරූප/ලේඛන <u>නොවිය යුතුය</u>**)

<u>අවශ්‍ය ලේඛන</u>

**1 නිසි ලෙස සම්පූර්ණ කරන ලද උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රය සහ උපාධිලාභීන් විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශ පත්‍රය** (A4 ප්‍රමාණයෙන් - අයදුම් පත්‍රයෙහි පිටුපස පිටුවේ ප්‍රකාශ පත්‍රය මුද්‍රණය විය යුතුය)

**2 උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව ගෙවූ බැංකු රිසිට්පත (රිසිට්පතෙහි කහ පිටපත / මාර්ගගතව ගෙවීම් සිදුකළ රිසිට්පත)**

**3 සිංහල භාෂාවෙන් ලබාගත් උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් / වෙනත් භාෂාවක උප්පැන්න සහතිකයක් නම් එහි සිංහල පරිවර්තනයේ සහතික කළ පිටපතක්** (උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රයෙහි සඳහන් කරන ලද නම සිංහල උප්පැන්න සහතිකයේ / උප්පැන්න සහතිකයේ සිංහල පරිවර්තනයේ සඳහන් නමට සම්පූර්ණයෙන්ම සමාන විය යුතුය.)

**4** ශිෂ්‍ය වාර්තා පොතේ මුල් පිටු දෙකෙහි පරිලෝකනය (scan) කළ පිටපත

{E-mail Subject පහත පරිදි විය යුතුය:
Index number, Registration number, Name of the degree
උදාහරණය: CPM 22xxx, MC 103xxx, Bachelor of Science Honours in Accounting Degree}

විද්‍යුත් තැපැල මගින් එවන ලද ඉහත ලේඛන අප වෙත ලැබුණු බව තහවුරු කරමින් දින 14ක් ඇතුළත උපාධිලාභීන් වෙත පිළිතුරු විද්‍යුත් තැපැලක් (Reply email) යොමු කරනු ලැබේ. එබැවින්, ඉහත ලේඛන එවීම සඳහා ඔබගේ පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කළ යුතුය. ඉහත ලේඛන අප වෙත යොමු කළ දින සිට දින 14ක් ඇතුළත පිළිතුරු විද්‍යුත් තැපැලක් නොලැබුනේ නම්, අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය අමතන්න. (දුරකථන අංකය: 011 2758220)

**විද්‍යුත් තැපැල මගින් එවන ලද ලේඛන අතුරින් පහත සඳහන් කර ඇති ලේඛනයන්හි <u>මුල් පිටපත් ද</u> 2026.06.12 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.** ඒ සමග රු. 70/= ක මුද්දරයක් අලවන ලද (අඟල් 09 × 04 ප්‍රමාණයේ) තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවිය යුතු අතර, එහි වම්පස ඉහළ කෙළවරේ ලියාපදිංචි අංකය, විභාග අංකය සහ අදාළ පාඨමාලාව සමඟ උපාධියේ නම සඳහන් කර තිබිය යුතුය. (*<u>උපාධි ප්‍රදානෝත්සවයට අදාළව විශ්වවිද්‍යාලය මගින් ඔබ වෙත යොමු කරන ලිපි තැපැල් මගින් එවීම සඳහා මෙම ලිපි කවරය අත්‍යාවශ්‍ය වන අතර</u>*, මේ පිළිබඳව උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රයේ අංක 02 යටතේද සඳහන් කර ඇත.)

__ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ලේඛන (මුල් පිටපත්)__

**1 නිසි ලෙස සම්පූර්ණ කරන ලද උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රය සහ උපාධිලාභීන් විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශ පත්‍රය (A4 ප්‍රමාණයේ)**
**2 උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව ගෙවූ බැංකු රිසිට්පත (රිසිට්පතෙහි කහ පිටපත / මාර්ගගතව ගෙවීම් සිදුකළ රිසිට්පත)**
(සිංහල උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත / උප්පැන්න සහතිකයේ සිංහල පරිවර්තනයේ සහතික කළ පිටපත හා ශිෂ්‍ය වාර්තා පොතේ මුල් පිටු දෙක පරිලෝකනය (scan) කර ලබාගත් මුද්‍රිත පිටපත (ඉහත ලැයිස්තුවේ අංක 03 සහ 04) __**තැපෑලෙන් එවීම**__ අවශ්‍ය නොවේ.)

__තැපැල් ලිපිනය__

Senior Assistant Registrar
Academic Student Affairs, Publications & Examinations Division
University of Sri Jayewardenepura
Gangodawila, Nugegoda

**Student Payment System සඳහා පහත සබැඳිය භාවිතා කරන්න:**

**https://stu.payments.sjp.ac.lk/sjp/slipPrintingOnlinef.php**
(Student Payment System මගින් ගෙවීම් රිසිට්පත ලබාගැනීමට පෙර 'Income Type' මෙනුව යටතේ ඇති 'Convocation Fees' තෝරා ඇති බව තහවුරු කරගන්න.)

__සැලකිය යුතු අමතර තොරතුරු__

**උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රයෙහි සඳහන් කරන ලද නම සිංහල උප්පැන්න සහතිකයේ / උප්පැන්න සහතිකයේ සිංහල පරිවර්තනයේ සඳහන් නමට සම්පූර්ණයෙන්ම සමාන විය යුතුය.**

**උපාධි ප්‍රදානෝත්සව අයදුම් පත්‍රය A4 ප්‍රමාණයේ විය යුතු අතර, එම A4 කඩදාසියෙහිම පිටුපස පිටුවේ ප්‍රකාශ පත්‍රය මුද්‍රණය විය යුතුය.**

**උපාධි ප්‍රදානෝත්සව ලෝගු ලබාදීම 2026 ඔක්තෝබර් 10 සහ 11 යන දිනවල කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේදී සිදු කරනු ඇත. උපාධි ප්‍රදානෝත්සව ලෝගුව ලබාගැනීමට පෙර, පුස්තකාලයෙන් ලබාගෙන ඇති සියලු පොත් ආපසු භාරදීමත්, ශිෂ්‍ය හැඳුනුම්පත පීඨ කාර්යාලයට භාරදීමත් කළ යුතුය.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය

රු. 70/= ක මුද්දරයක් අලවන ලද (අඟල් 09 × 04 ප්‍රමාණයේ) තම ලිපිනය ලියන ලද ලියුම් කවරය පහත පරිදි විය යුතුය. (__උපාධි ප්‍රදානෝත්සවයට අදාළව විශ්වවිද්‍යාලය මගින් ඔබ වෙත යොමු කරන ලිපි තැපැල් මගින් එවීම සඳහා මෙම ලිපි කවරය අත්‍යාවශ්‍ය වන අතර එය පැහැදිලි අත්අකුරින් පහත දක්වා ඇති ආකෘතිය අනුව එවීමට වගබලා ගත යුතුය__)

| | |
|---|---|
| Index No: CPM 22xxx, , Registration No: MC 103xxx<br>Name of the degree with the relevant course | Stamp |
| මෙම පෙදෙසේ කිසිවක් නොලියන්න | ඔබගේ නම සහ ලිපිනය |